

# ලෝකාලෝකය

2013 සැප්තැම්බර් - ඔක්තෝම්බර්

පටන්ගැන්මෙහිදී දෙවියන්වහන්සේ
අහසත් පොළොවත් මැවූ සේක ( උත්පත්ති 1.1 )

මෙම සඟරාව නොමිලේ ලබා ගැනීමට අපට ලියන්න.

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය, 7 විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 6.

# රවින්ද්‍ර ජයලත් ඉදිරිපත් කරන
# ගීතිකා පිටුව



ඔබ ජීවිතේ මේ මැකිලා නොයයිදෝ
සෙවනැල්ල වාගේ රූයේ
හිමි යේසු ප්‍රේමේ පිළිගන්න මෙදිනේ
ලැබගන්න ජීවේ සදා

මවගේ කුසේ දී දුටුවේ ඔබේ රූ
දෙවිඳුන් තමයි ප්‍රේමයේ.........//
සිතුවේද ඔබ මේ පුදුමේ විශාලේ
දෙවිඳුන් අසයි ප්‍රේමයේ

රුධිරේ ගැලුවේ කුරුසේ ගසේදී
ඔබගේ පවේ ශාපයයි................//
සැම පාප ඉසුලූ සමිඳුන්ය යේසු
ඔබගේ සිතේ දොර ළගයි.................//

අදමයි දිනේ ඇයි ලතවෙන්නේ තවමත්
පිළිගන්න දෙවිඳුන් වදන් ................/
මරණේ දිනූ යේසු හිමි වේය ළග දැන්
අදහා ලබන් පව් කමා.................//

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| <u>ස්ථායි</u> | ස | ම | මම | ප | ධ | - | ස | ම | මම | ප | ධ | - |
| | ස්ස් | රි | රිග | ධ | ප | මධ | ප | - | - | - | - | - |
| | ස | ග | ගම | ප | ප | ප | ස | ග | ගම | ප | ප | ප |
| | ස් | රි | රිස් | ධ | ප | - | ම | ම | - | - | - | - |
| <u>අන්තරා</u> | ප | ස් | ස්නි | ස් | ස් | - | නිස් | රි | රිස | නි | ධ | - |
| | ම | ධ | ධධ | ප | ධ | නි | නි | ධ | ප | - | - | - |
| | සස | රි | රිග | ග | ග | - | ගග | ම | මග | රිග | රි | - |
| | නිස | රි | රි | රි | ග | ගරි | ස | - | - | - | - | - |

# හදවතේ ගැස්ම



අප රටේ බස් රථයකට ගොඩ වූ විට එහි ඉදිරියේ මලින් හා දිදුලන විදුලි පහන් වලින් සැරසුනු දේව රූප වමේ සිට දකුණටම වේ. විවිධ තැන්වල වෛවර්ණයෙන් යුත් දේව ප්‍රතිමා සහ සිතුවම් නිතර අපගේ ඇහැ ගැටෙයි. මහා අපරාධයක් සිදුවන විට "උඩ ඉන්න දෙවියන්ටවත් පේන්නෙ නැද්ද?" උඩ බලා ප්‍රශ්ණ අසන ගැමියෝත් තිස්තුන් කෝටි දෙවි දේවතාවුන්ගේ ආරක්ෂාව පතන රටවැසියෝත්, ලෝකවාසීනුත් ලෝකය පුරා වෙසෙති. එහෙත් මේ කියන ආකාරයේ දෙවිවරු ලෝකයේ සිටිත්ද?

ලක්ෂ 70000 කට ආසන්න වූ ජන ඝනත්වයකින් යුතු මුළු මහත් ලෝකය තුල දෙවිවරු කොපමණ වෙසෙත්ද? පුරවැසියකුට අවම වශයෙන් දෙවිවරු කී දෙනෙකුගේ බැල්ම හා ආරක්ෂාව ලැබෙන්නේද? ලෝකයේ දේවත්වය නම් වූ සංකල්පය පිළිබඳ වූ මතිමතාන්තර විවිධාකාරය. ඇතැම්හු අදේවවාදයත්, ඇතැම්හු බහුදේවවාදයත් තවත් සමහරෙකු ඒකදේවවාදයත් වශයෙන් සිය ඇදහීම් සකසා ගෙන ඇත.

අදේවවාදය යනු දෙවිකෙනෙකු නැත යන මතයයි . එහෙයින් දෙවියන් හෝ යක්ෂයන් යනු තම සිත් තුලම පැන නගින සිතුවිලි ධාරාවෙන් උපදින නිර්මාණයක් පමණක් යැයි ඔවුන්ගේ මතය වේ.

බහුදේවවාදය විශාල වශයෙන් ලොව පුරා දක්නට ලැබේ. සංගීතයට එක් දෙවි කෙනෙකි. නුවණින් උසස් තව දෙවිකෙනෙකි. ව්‍යාපාරික ලෝකයට වූ තව දෙවිකෙනෙකි. යුද්ධ කරන හා පලි ගන්නා දෙවිකෙනෙකි. ප්‍රදේශයෙන් ප්‍රදේශයට, රටින් රටට මේ දෙවිවරු රන් රිදී වලින් හෝ මැටි සිමෙන්ති වලින් නිර්මාණය කොට ඇත. මනසින් උසස් යැයි සලකන මනුෂ්‍යාද මේ මූර්ති ශිල්පීන්ගේ විශිෂ්ඨ නිර්මාණයන් ඉදිරියේ වැඳ වැටී ඔවුන්ට නමස්කාර කරයි.

මේ දෙවිවරුන්ට ඇස් ඇත එහෙත් මනුෂ්‍යාගේ දුක පෙනෙන්නේ නැත. කටක් ඇති නමුත් මනුෂ්‍යා හා කතා කරන්නේ නැත. අත් දෙකක් නොව විටක කිහිපයක් තිබුනද මනුෂ්‍යා දුසිරිතෙන් හා අනතුරින් වලක්වන්නට ඒවා දිගු වන්නේ නැත. නාස් පුඩු ඇති නමුත් ආශ්වාසයක් හෝ ප්‍රාශ්වාසයක් නැත. පාදයන් ඇති නමුත් මිනිසාට පිහිට වනු පිණිස මේ දෙවිවරුන්ට ඇවිදින්නට නොහැක. එබැවින් මිනිසාට දෙවිවරු අසලට යනු විනා මිනිසා අසලට විත් පිහිට උපකාර කරන්නට ඔවුහු අපොහොසත් වෙති. එහෙයින් මේ දෙවිවරුන්ට පුදන සුවඳැති මල් කැකුළු ඔවුන් ඉදිරියේම පරවී යෑම වැළැක්වීමට නොහැකිය. දෙවියන්ට පුදන ආහාර පූජාව අනුභව කරන්නට ඒ දෙවියන්ට නොහැකි බැවින් එය මිනිසකුගේ කුස ගින්දර නිවන්ට යොදා ගන්නේ නම් එය වඩා ප්‍රතිඵලදායක කටයුත්තක් වනු ඇත. ඒ දෙවිවරුන්ට පුදන පඩුරු භාවිතා කරන්නේ දෙවියකු නොව ඒ ඒ ස්ථාන භාර මිනිසුන්ය.

එසේ නම් දෙවිවරු කී දෙනෙක් ලොව සිටීද? ඔවුන් මිනිසා මත යැපේද? නැතිනම් මිනිසාට ඔවුන්ගෙන් පිහිට ලැබේද? දෙවිකෙනෙකුගේ සැබෑ ස්වරූපය කෙසේ විය යුතුද?

දෙවිකෙනෙකු යනු මිනිසාටත් වඩා මනසින් උසස් වූ එනම් සිත, කය, වචනයෙන්, ක්‍රියාවෙන් පාරිශුද්ධවූ උත්තරීතර පුද්ගලයෙකි. බලයෙන්, ශක්තියෙන් තේජසින් හා ජීවමාන බවින් පිරිපුන් අයෙකි. එවැනි අයෙකු සිටීද? ඔව් ඇත්තෙන්ම සිටියි. ඒ මැවුම්කාර දෙවියන්වහන්සේය. උන්වහන්සේ මනුෂ්‍යයන්ගේ පියවි ඇසට නොපෙනේ. උන්වහන්සේ ශුද්ධය, උන්වහන්සේ සර්වබලධාරී දෙවියන්වහන්සේය. මනුෂ්‍යයාට ඇත්තේ පව්කාර දෑසක්ය, පව්කාර මනසක්ය. එබැවින් කිසිවිටක පව් නොකරන්නාවූ ශුද්ධ දෙවියන්වහන්සේ පව්කාර දෑසට පෙනෙන්නේ නැත. උන්වහන්සේ දැකිය හැකි වන්නේ මිනිසකුගේ ආධ්‍යාත්මයට හෙවත් ආත්මික ඇස් වලට පමණි.

උන්වහන්සේට බලය හිමිය. මිනිසාව දකින ලෙස වූ දිව්‍යය ඇස්ද, මිනිසාට කථා කරන්නට දිව්‍යය වචනයද උන්වහන්සේ සතුය. සුළඟ කොහේ සිට එන්නේද? කොහේට යන්නේද? කියන්නට අප නොදන්නාක් මෙන් උන්වහන්සේගේ ක්‍රියාත්මක වීමත් එසේය. පීඩාවට පත්ව සිටින මිනිසාට සැනසිලිකාරයකු ලෙසත්, බලවන්තයකු ලෙසත්, පාපයට අධිපති වූ යක්ෂයා හා ඔහුගේ දූතයන්ට එරෙහිව උන්වහන්සේ ක්‍රියා කරමින් සිටී. පුද්ගලයකු වශයෙන් දෘෂ්‍යමාන නොවුවද අදහන ජනයා මධ්‍යයේ වැඩ වාසය කරමින් ක්‍රියා කරන සේක. උන්වහන්සේ මෙසේ කී සේක. **"වෙහෙස වෙන්නාවූ බර උසුලන්නාවූ සියල්ලනි මා වෙතට එන්න, මම නුඹලාට සහනය දෙමි" (මතෙව්11:28)**. සහනය සුවය සමාදානය ගෙන දෙන්නාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එසේ කී සේක. ඇදහිල්ල කරණකොට ගෙන පාපිෂ්ඨයන් ධර්මිෂ්ඨයන් බවට පත් කිරීමත්, රෝගීන්ට නිරෝගී සුවය ලබා දීමත්, යක්ෂාවේෂ වූවන්ට නිදහස දීමත් ආදී බොහෝ හාස්කම් පිළිබඳ ඔබ අසා හෝ දැක ඇත. සැබවින් මිනිසා කරන්නාවූ යාච්ඤා අසන්නාවූ දෙවිකෙනෙක් සිටී. මිනිසාගේ දුක පෙනෙන දුක අසන හා ඊට පිහිට වෙන දෙවි කෙනෙකු ලොව ජීවමානව වැඩ වසයි. ඒ සර්වබලධාරී එකම දෙවියන්වහන්සේ වෙතට ඔබත් එනතුරු උන්වහන්සේ ආසාවෙන් බලා සිටින සේක. ප්‍රේමයෙන් ඔබ කැඳවන සේක. ඔබ එම දෙවිඳුන් හඳුනාගත්විට ''උඩ ඉන්න දෙවියන්ට වත් පෙනෙන්නේ නැතිදැ''යි කිසිවිටක ඔබ විසින් ප්‍රශ්ණ නොකරනු ඇත. මන්ද ඔබ සිතන්නා සේම පොළොවට වඩා ඉහල වූ සූර්යාටත් ඉහල තිබෙන ස්වර්ගයෙහි වැඩ වසන උන්වහන්සේ ඔබගේ ජීවිතයේ සියළු දවස් දැක සියල්ල යහපත් වන්නට සලස්වන සේක.

ලෝකයා ඔබව තනිකර ඇත්ද? පාපය ඔබගේ සිත, කය, වචනය, ක්‍රියාව, දූෂණය කොට ඇත්ද? මව්පියන් නෑදෑ හිත මිතුරන් ඔබ ප්‍රතික්ෂේප කළේද? ජීවන ගමනේ විඩාව නිසා එය අතර මඟ නතර කරන්නට සිතුවේද? ප්‍රිය සොයුර සොයුරිය, ඔබගේ ජීවිතය අගනා වස්තුවක් කොට තකන ඔබේ නිර්මාතෘවරයා වූ දෙවියන්වහන්සේට ඔබේ සිත භාර කරන්න. මන්ද එවිට ඔබ කිසිදිනක තනි නොවනු ඇත. ජීවිත ගමනේ විඩාවට පත් නොවනු ඇත. උන්වහන්සේ ඔබට සෙනෙහෙබර පියෙක්ව, ආදර්ශමත් ගුරුවරයෙක්ව, කල්‍යාණ මිතුරෙක්ව, සදාකාලික ප්‍රේමවන්තයෙක්ව හා

ආලෝකයේ මග පෙන්වන්නෙකුව ඔබ හා සිටිනු ඇත. මව් ඇකයේ කිරි බොමින් සිටින දරුවකු හැර දමා යන්නට මවකගේ සිතට වාරු නැගේද? එය එසේ වන්නටද පුළුවන. එහෙත් මේ සදාකාල පියාණන්වහන්සේ ඔබ හැර නොයන සේක.

මක්නිසාද දෙවියන්වහන්සේගේ නිපැයුම වූ ඔබ අයිති උන්වහන්සේටය. එහෙත් එය ශුද්ධකමෙන් මුදාකොට උසස් තත්වයකට පත්කරන්නට මත්තෙන් යක්ෂයා සොරා ගනු ලැබුවේය. ස්වකීය බලයෙන් නිෂ්පාදිත මිනිසා නැමති නිපැයුම යලි ලබාගන්නට උන්වහන්සේට මිළය ගෙවන්නට සිදුවිය. එය අංශු මාත්‍රයකින් හෝ නොඅඩුව ගෙවූ ක්‍රිස්තුස්වහන්සේ අද ලොව මිනිසුන් යලිත් සිය බලවත් හස්තය යටතට ගෙන එමින් සිටී.

යක්ෂයාගේ සිරබාරයේ සිටින මිනිසුන් යේසුස්වහන්සේගේ රුධිරයෙන් සෝදා ශුද්ධාත්මයාණන්වහන්සෙගෙන් මුදා කොට ස්වර්ගීක උරුමක්කාරයන් නැමැති උසස් තත්වයෙන් පිදුම් ලද්දවුන් හැටියට දෙව්පියාණන්වහන්සේට ඔබ පිළිගන්වන්නට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සැදී පැහැදී සිටින සේක. ඉතින් කිසිදු චකිතයක්, බියක් හෝ කැළඹීමක් ඔබගේ සිතේ නොවේවා. මක්නිසාද මනුෂ්‍යයා ඔබගේ පිටස්තර පෙනුම බලන නමුත් දෙවියන්වහන්සේ ඔබගේ අභ්‍යයන්තරය දෙසම බලන සේක. ඔබ ගැන වඩාත් හොඳින් තේරුම් ගත හැක්කේ උන්වහන්සේට පමණයි. එබැවින් ලෝකයේ එකම ජීවමාන දෙවිකෙනෙකු සිටින බව සැක නොකොට විශ්වාස කරන්න. එවිට ඔබගේ ජීවිතය ඇදහිය නොහැකි පරිවර්ථනයකට භාජනය වනු ඇත. එවිට ඔබ නියම සැබෑ වූ මාර්ගයේ ගමන් කරනු ඇත. මිනිසා සැබෑ ජයග්‍රාහකයෙකු බවට පත්කිරීම සඳහා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නම් ප්‍රේමණීය ගැළවුම්කරුවාගේ ජීවිතය කුරුස ගසක් මත මරණයට කැප කරන ලදී. ජාති, ආගම් බේදයකින් තොරව සැම මනුෂ්‍යයකුම පාපයෙන් ගැළවීම ඒ උදාරතර යාගයේ අරමුණ විය. මෙය ඔබට නොවැටහෙන බව සැබෑවකි. පුද්ගලයකුගේ මරණය අපගේ පාපයට ගැලවීමක් වූයේ කෙසේද? පාපය නැමැති සිරභාරයට ඔබ ගනු ලැබූ බැවින් ඔබ නිදහස්කර ගන්නා පිණිස මිළය ගෙවන්නට තවත් සිරකරුවකුට නුපුළුවන. එබැවින් පාපයේ කුලිය ලෙස මරණ දඩුවම නියමව සිටි පාපිෂ්ඨයකු වූ ඔබ හා මා විඳිය යුතු මරණයේ දඬුවම උන්වහන්සේ තමා පිටට ගත් බැවින් අපි මරණය වෙනුවට ජීවිතය ලැබුවෝ වෙමු. ඔබත් ඒ සදාකාල ජීවනයේ උරුමක්කාරයෙකු වන්නට සූදානම්ද? සත්‍යය වූ දෙවිකෙනෙකුගේ බලයෙන් ශක්තිමත්ව පාපය නැමැති සතුරා ඔබේ ජීවිතයෙන් පිටුවහල් කරන්නට ඔබ කැමැතිද? එසේ නම් දැන්ම ඔබ උන්වහන්සේට ඔබේ ජීවිතය පිළිගන්වන්න. ඔබේ හදවතට උන්වහන්සේ පිළිගන්න. මක්නිසාද ''මාර්ගයද , සත්‍යයද, ජීවනයද මම''යැයි යේසුස්වහන්සේ කී සේක. මෙහිදී උන්වහන්සේ මාර්ගය වෙනුවට ''මාර්ග යක්'' නම් වචනය භාවිතා කර තිබුනේ නම් වෙනත් මාර්ග ඇති බව සිතිය හැක. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එකම මාර්ගය උන්වහන්සේ බව ඔබට ඒ මාර්ගයේ මුල් පියවර තබන විටම හැඟී යනු නොඅනුමානය. උන්වහන්සේට ඇත්තේ අදෘෂ්‍යයමාන හස්තයකි. එය පුදුම හා ලකුණුවලින් පිරී ගිය බලවන්ත දෑතකි. උන්වහන්සේට ඇත්තේ කිසිවිටක වෙනස් නොවුනාවූ , වෙනස් නොවන්නාවූ එකම ඉගැන්වීමකි. එකම ව්‍යවස්ථාවකි, එකම

ලියවිල්ලකි. එනම් සත්‍යයෙන් පිරිපුන් ශුද්ධ වූ බයිබලයයි. එමෙන්ම උන්වහන්සේගේ ප්‍රේමය පුදුම සහගතය.

ලොව මවා පාලනය කරන දෙවිකෙනෙකු ලොව සිටීද ? මේ ගැටලුව පිළිබඳ වෙනම වෙන්වූ සාකච්ඡාවක් වෙත ඔබව ගෙන යාමට අපට පුළුවන. කරුණු රාශියක් ඉදිරිපත්කල හැක. එහෙත් සරලව එය අවබෝධ වනු පිණිස මේ ගැන මෙනෙහි කරන්න.

සුළඟ කොහේ සිට එන්නේද? කොතැනට යන්නේද? කියා අප නොදනිමු. සුළඟ වනු මෙයයි කියා දෑතින් හසු කරගන්නට හෝ දෙනෙතින් දකින්නට අපි අසමත් වෙමු. එහෙත් ගත සිත සිසිල් කරමින්, ගස් කොළන් සොලවමින් විටක සුන්දර වූ ආශ්වාදයක්ද විටෙක භයානක වූ විනාශයක්ද සිදු කරමින් සුළඟ කියාපානුයේ එය අවට පරිසරයේ තිබෙන බවයි. එලෙසින්ම දෙවියන්වහන්සේගේ ආත්මය නම් වූ සර්වබලධාරී සුළඟ පාපය දොරගුළු ලත් මිනිස් සිත් විවර කරමින් ලෝකයේ බල පරාක්‍රමයන් සොලවමින් ලොව පුරා සැරිසරයි. පව් කරන්නට අකමැති වුවත් ඔබ පාපයට වහල් වුයේ පාපයේ දූතයන් ලෙස හැඳින් වූ යක්ෂයාගේ වහලෙක් බවට පත්ව ඇති නිසා නොවේද? පිනට-පව මෙන් , ඉහලට-පහල මෙන්, ආලෝකයට-අඳුරමෙන්, යහපතට-අයහපත මෙන් එකිනෙකට විරුද්ධ ක්‍රියා කරයි. යහපත කරන්නාට විරුද්ධව අයහපත කරන්නෙක්ද වෙසෙන බව අප පිලිගත යුතුය. රෝග සුව කරමින්, යක්ෂාත්ම වලින් බැඳුම් ලැබුවන් නිදහස් කරමින් වෙහෙසෙන්නන්ට සහනය දෙමින් දේව බලය ලොව පුරා ක්‍රියාත්මක වන විට මහපොළොව නුහුලන, මිනිස් ඇස් හැර බැලිය නොහැකි පාපයන් වෙත මිනිස් සිත් ඇද දමන්නට යක්ෂයා නැමැති පාපයේ මුලාරම්භකයා උත්සහ දරමින් සිටී. මෙසේ මිනිස් ඇතුලාන්තයේ හට ගන්නාවූ අරගලයෙන් ජය ගන්නට මිනිසා තැත් කෙරුවද ස්වෝත්සහය ඊට නොසෑහෙන බව අවබෝධවන විට මිනිසා පාපයේ ගැඹුරට වැටී අවසන්ය.

පාපය මෙලොව උපදින කිසිදු මිනිසෙකුට නුහුරු දෙයක් නොවේ. මිහිමත බිහිවන ඕනෑම පෘථග්ජන මිනිසෙකු අතින් පාපයක් සිදුවීම අසාමාන්‍යක් නොවේ. ඔබ පාපයක් නොකල බව හෝ නොකරන්නට සිටින බව හෝ කිව හැක්කේ කාටද? කුමන ආගමක් දහමක් අනුව දිවි ගෙවූ නමුත් ඔබ මනුෂ්‍යයකු නිසා ඔබගේ දිවියේ එක් වරක් හෝ ඔබ පාපයක් කරතිබේ. යහපත කරන්නට දැන ගෙනත් ඔබ යහපත නොකරන්නේ නම් එය පාපයය. මක්නිසාද යහපත යටපත් වූ විට හෝ ඔබ විසින් යටපත් කරනු ලැබූ විට අයහපත ඉස්මතු වේ. මනුෂ්‍යයකු මව් කුසේ පිළිසිඳ ගන්නා විටම ඔහු හෝ ඇය පාප සහිතව මව් කුසේ ගැබ් ගනී. ඒ නිසා පාපය නොකර යහපතම කරන මනුෂ්‍යයයෙක් මිහිපිට නැත.

පාපය නැමැති සතුරා ජීවිතයෙන් පලවා හරින්නට හෝ සදහටම පරාජය කරන්නට මිනිසා අපමණ වෙහෙස දරනවා නොවේද? එහෙත් පාපය මිනිසාගේ සිත් සතන් අවුල් ජාලාවකට ගෙන ගොස් ඇත. පාපයට එරෙහිව මිනිස් අභ්‍යයන්තරය කොතෙක් සටන් කලත් , ආධ්‍යාත්මය යටපත් කරමින් සිය අකමැත්තෙන් හෝ පව්කරන්නට මිනිසා පෙළඹී ඇත. දිගින් දිගටම මිනිසා විසින් තම අභ්‍යයන්තරයේ පවතින ආධ්‍යාත්මික සටන පරාජය වීම නිසා එය දුර්වලව පාපයට

එරෙහිව යලි යලිත් සටන් කරන්නේ නැත. එවැනි මිනිසුන් සිය කැමැත්තෙන්ම පව් කරන අතර, පාපය ඔවුන්ගේ සතුට බවට පත්ව ඇත.

මව් කුසින් බිහිවන බිළිඳා තමා ලද මව් සෙනෙහස හා උණුසුම නිසා ''අම්මේ'' යැයි ආමන්ත්‍රණය කරන්නා සේම කුමන ආගමකට අයත් වුවද විපත, කරදරය, පීඩාව හමුවේ ''දෙවියනී'' යනුවෙන් ආමන්ත්‍රණය කරන්නට අප සැවොම හුරුව සිටින බව පෙනේ. මිනිසාගේ මුලාරම්භය කොතැනක කෙසේ සිදු වී දැයි ලොවම පිළිගන්නාවූ **පොදු මතයක්** නොවුවත් ආදී ශිෂ්ඨාචාරවල පටන්ම මිනිසා දේවත්වය නම් සංකල්පය තුල සිටි බැව් පැහැදිලිව සාක්ෂි ඇත. ඇත්තේ එකම ජීවමාන, මැවුම්කාර දෙවියන්වහන්සේ පමණයි. මෙය විශ්වාස කරන්නා වාසනාවන්තයෙක්ය.

**මෙසේ උන්වහන්සේට කතා කරන්න.**

''මා නොදන්නාවූ මා නොදැක්කාවූ එකම ජීවමාන දෙවියන්වහන්ස, මා මෙතෙක් ඔබ කෙරෙ කුමන හේතුවක් මත හෝ විශ්වාසය නොතැබීම ගැන මට බොහෝසේ අනුකම්පාව හා දයාව දැක්වුව මැනව. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නම් නිකැලැල් ධර්මිෂ්ඨ දේව පුත්‍රයාගේ කුරුස පූජාවෙන් ගලා ගිය ලේවලින් මගේ පාපය සහමුලින්ම සෝදා හැරිය මැනව. දැනටමත් මා පාපයෙන් නිදහස් කරන්නට ඔබ වහන්සේ මිළය ගෙවා ඇති බැවින් ඔබට ස්තුති කරමි. ජීවමාන දෙවිකෙනෙක් ලොව සිටින බවට සදාකාලයටම විශ්වාස කරනු පිණිස මා තුළට පැමිණිය මැනව . පාප බරින් මා නිදහස් කල මැනව. වෙහෙසුනාවූ මට සහනය දෙනු මැනව. මා නව මිනිසකු ලෙස බිහි කල මැනව. ඔබ වහන්සේට සදකාලයටම ප්‍රශංසා වේවා. දෙවියන්වහන්ස මා මේ දේ ඉල්ලා සිටින්නේ යේසුස්වහන්සේගේ නාමයෙන්, ආමේන්

**සංස්කාරක : එස්.මෙත්තානන්ද**
0776 044 339

*ලෝකාලෝක සගරාව අන්තර්ජාලයේදී කියවන්න.*
*පිවිසෙන්න !*

**www.christianfellowshipcentre.com**
**0112 581 901**

# ළමා පිටුව

## පුංචි ඔබටත් ඊර්ෂ්‍යා හිතෙනවද?



ආදරණීය දුවේ, පුතේ අද මම මුලින්ම පුංචි ඔබෙන් ප්‍රශ්නයක් අහන්න කැමතියි. ඔබේම පංතියේ ළමයෙක් හෝ ඔබේ යාළුවෙක් ඔබට වඩා ඉගෙන ගැනුමට දක්ෂයි නම් හෝ ගුරුවරුන් ගුරුවරියන් ඒ ළමයාට ආදරේ කරනවානම් ඔබ කැමතිද? එවැනි අවස්ථාවලදී අපේ සිතේ ඒ පිළිබඳව තරහක් එහෙමත් නැත්නම් ඒ අය ලබන ආදරය ලබා ගන්න අපිටත් සිතෙනවා නේද? එනිසා අපි බොහෝ වෙලාවට කරන්නෙ ඒ ආදරය කරන අය සමඟ තරහ වෙනවා, නැත්නම් ඒ අයට ලැබෙන ඒ දේ ලබාගන්න බැරි වෙන්න මොනව හරි ඒ අයට කරන්න බලනවා. ඔව් දුවේ, පුතේ තමාට නැතිදෙයක් වෙන කෙනෙකුට ලැබෙනවට තියෙන අකමැත්තට තමයි ඊර්ෂ්‍යාව කියන්නෙ. පුංචි ඔයගොල්ලන් විතරක් නොවෙයි , වැඩිහිටියන් වන අපි ළඟත් මෙම ඊර්ෂ්‍යාව තිබෙනවා. මේ දේ සමහරුන් ළඟ අඩුවෙනුත් සමහරුන් ළඟ වැඩියෙනුත් තිබෙනවා. නමුත් සැම දෙනාම මෙය තමන් ළඟ තිබෙන බව පෙන්නවන්න කැමති නැහැ. හැමදෙනාම ඒක හංගගෙන ජීවත් වෙන්න උත්සහ කරනවා. නමුත් දුවේ , පුතේ අපි කොපමණ ඒ දේ හැංගුවත් එය අප ළඟ තිබෙන බව අපි කරන කියන දේ වලින් අනිත් මනුෂ්‍යයන්ට හොදින්ම පෙනෙනවා.

ඔව් දුවේ, පුතේ තමාට නැති දෙයක් වෙනත් කෙනෙකුට ලැබීම පිළිබඳව තිබෙන අකමැත්ත එනම් මේ ඊර්ෂ්‍යාව නිසා අද හැම තැනකම ඉතාමත් අවාසනාවන්ත බොහෝ දේවල් සිදුවන බව අපට අහන්න, දකින්න ලැබෙනවා. මේ ලෝකයේ පළමුවෙනි මිනීමැරීම සිදුවුනෙත් මේ ඊර්ෂ්‍යාව නිසයි. දෙවියන්වහන්සේ විසින් මැව් මුල් මව්පියන් වූ ආදම් සහ ඒවාගේ දරුවන් වූ කායින් සහ ආබෙල් උන්වහන්සේ වෙතට පූජාවන් රැගෙන යාච්කදා කිරීමට ආවා. ආබෙල් වන මල්ලී දෙවියන්වහන්සේ පවසා තිබෙන අකාරයටම පූජාව ගෙන ආ නිසා උන්වහන්සේ පිළිගත්තෙ ඔහුගේ පූජාවයි. එනිසා කායින් වන අයියට හොඳටම තරහ ගිහින් ආබෙල්ව මැරුවා. බලන්න ඊර්ෂ්‍යාව නිසා තමන්ගෙ එකම මල්ලීව මරන්න තරම් කායින් දරුණු වුණා. ඔව් දුවේ, පුතේ අපේ මේ හිත ඇතුලෙ අනෙක් අය නිසා ඇතිවෙන ඊර්ෂ්‍යාවට මහත් භයානක දේ කරන්න පුළුවන්. මේ ලෝකයේ සිදුවන බොහෝ භයානක අපරාධ වලට මූලික හේතුව වෙන්නෙ මේ ඊර්ෂ්‍යයාවයි. පුංචි කාලෙ සමගියෙන් ඉන්න එකම පවුලෙ සහෝදර සහෝදරියන් වැඩිහිටියන් වූ විට දෙමව්පියන්ගෙ දේපල වලට රණ්ඩු වෙනවා. තවත් අය වෙනත් අයට අයිති දේවල් බලෙන් ලබා ගන්න උත්සහ කරනවා.

මිනිසුන් අතරේ තිබෙන එකමුතුකම බිඳින යක්ෂයගෙ ප්‍රධානතම ආයුධය වන්නෙත් මේ ඊර්ෂ්‍යාවයි. නමුත් දුවේ පුතේ ඊර්ෂ්‍යාව නිසා අනෙක් අයට අවැඩක් කිරීමට සිතන අයට එකෙන් අලාභයක් මිස කිසිදු වාසියක් සිදුවෙන්නෙ නැහැ. අන්න ඒ නිසා තමයි දේව වචනයේ මෙන්න මේ වගේ කියමනක් දෙවියන්වහන්සේ ලියා තිබෙන්නෙ **"මාංසයේ සනීපය නම් නිශ්චල සිතක්ය, එහෙත් ඊර්ෂ්‍යාව ඇට වලට දිරවීමක්ය" (හිතෝපදේශ 14:30 ).** ඔව් දුවේ, පුතේ ඒ පදයෙන් අපට පෙන්වනවා අපේ සිත් තුල තිබෙන ඊර්ෂ්‍යාවට මොනතරම් අයහපත් බලපෑමක් කිරීමට හැකිද කියා.

ආදරණීය දුවේ, පුතේ ඊර්ෂ්‍යාව නිසා පාඩු සිදුවන්නේ අපිටම නිසා ඊර්ෂ්‍යා වීමෙන් පලක් නැති බව අපිට තේරෙනවා නේද? කොහොමද අපි එකෙන් ජය ගන්නෙ? ඔව් දුවේ, පුතේ අපිට ඊර්ෂ්‍යාව තිබෙන බව අපි මුලින්ම පිළිගත යුතුයි. එවගේම අපි තේරුම් ගත යුතයි ඊර්ෂ්‍යාවෙන් අපට අවාසියක් මිස වාසියක් ගෙන එන්නේ නැති බවත්. එනිසා දුවේ, පුතේ ඔබට නැති දෙයක් වෙනත් කෙනෙකු ලබන විට ඒ අයට ඊර්ෂ්‍යා නොවී තව තවත් ඒ අයට ඉදිරියටම යෑමට උපකාර කරන්න. ඔබේම දෙමව්පියන් ඔබට වඩා ඔබේම සහෝදරයාට සහෝදරියට ආදරය කරන විට එය ඔබට අසාධාරණයක් ලෙස පෙනුනත් ඔබ එලෙස ඊර්ෂ්‍යා නොකරන විට ඔබට ආශිර්වාද කිරීමට දෙවියන්වහන්සේ ඔබත් සමඟ සිටිනවා. එදා ආබ්‍රහම්ට දෙවියන්වහන්සේ වෙනත් ස්ථානයකට යෑමට පැවසූ විට ආබ්‍රහම්ගෙ සහෝදරයාගේ පුතා වන ලොත්වත් අරගෙන පිටත් වුණා. මගදී ආබ්‍රහම්ගෙ වැඩකාරයින් සමඟ රණ්ඩු වූ නිසා ඔවුන් දෙපැත්තකට බෙදී යාමට තීරණය කලා. ඒ අවස්ථාවේදී ආබ්‍රහම් වැඩිමහල් වුනත් ලොත්ට කැමති පලාත තෝරා ගැනීමට ආබ්‍රහම් ඔහුට ඉඩ දුන්නා. ලොත් හොඳම පලාත තෝරාගෙන යන්න ගිය නමුත්, දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට ඒ මුලු පලාතම දෙන්න පොරොන්දු වුණා. අවසානයේදී ලොත්ට සියල්ලම අහිමි වුණා. (මෙම කථාව උත්පත්ති 13,14 සහ 19 යන පරිච්ඡේදවල සඳහන්වේ.) ඔව් දුවේ, පුතේ අපට ලැබෙනවට ආශාවන යහපත් දේ අනෙක් අයට ලැබෙන විට ඔවුන්ට ඊර්ෂ්‍යා නොවී ඒ අයට ඒ දේ ලබා ගැනීමට උපකාරකරනවා නම් අපට යහපත් දේ ලබා දීමට දෙවියනවහන්සේ අප වෙනුවෙන් ක්‍රියා කරනවා. ඉතිං ඒ නිසා දුවේ, පුතේ මීට පසු අන් අයට ඊර්ෂ්‍යා නොකරන්න තරයේම අධිෂ්ඨාන කර ගනිමු. ඉන් ජය ගැනීමට අවැසි ශක්තිය දිනපතාම අපි දෙවියන්වහන්සේගෙන් ඉල්ලමු.

**ආදරණීය යේසුස්වහන්ස, මම අන් අයට ඊර්ෂ්‍යා කර ඇත්තෙමි. ඒ ගැන මට සමාවන්න. මින් පසු අන් අයට ඊර්ෂ්‍යා නොකර සිටීමට මට උපකාර කල මැනව. ආමේන් !**

**තෙල්මා නැන්දා**

# කනවැන්දුම්යගේ ශෝකාන්තය සහ ක්‍රිස්තුස්වහන්සේ



( ලූක් 7 : 11 සිට 17 දක්වා කියවන්න)

තම එකම දරුවා මරණයට පත්වීම නිසා මහත් අසරණව සිටි නායින් නුවර විසූ ඒ අසරණ ස්ත්‍රියට යේසුස්වහන්සේගේ අනුකම්පාව නිසා මහත් ප්‍රීතියක් අත්විඳින්නට පුළුවන්කම ලැබුනාය. ඇය මහලු වයසේ සිටි වැන්දඹුවකි. ඇගේ තරුණ වයසේදීම ස්වාමිපුරුෂයා මරණයට පත්විය. ඒ වන විට ඇයට එක පුතකු පමණක් සිටි අතර ස්වාමිපුරුෂයාගේ අභාවයෙන් පසු ඇය තම පුතා සමඟ දුක්බර ජීවිතයක් ගෙව්වාය. සමහර විට ඇය තම දරුවා හදා වඩා ගැනීමට රැකියාවක් හෝ කුලී වැඩක් කරමින් නොසෑහෙන ලෙස දුක් විඳින්නට ඇත. කෙසේ හෝ ඇය තම පුතු යෞවන වයස දක්වා උස් මහත් කර ගත් නමුත් ඇය දැන් මහලු වයසේය. නැවත විවාහයක් ගැන සිතීමට වයසක් හෝ කාලයක්ද නොවේ. ඇයගේ එකම අරමුණ වූයේ තම පුතුට හොඳ අනාගතයක් උරුම කර දීමයි. හදිසියේම දුක ඇයව වෙලා ගත්තාය.

ඇගේ ජීවිතය නැවතත් දුකින් හා ශෝකයෙන් පිරී ගියාය. ඒ ඇගේ එකම සැනසීම හා බලාපොරොත්තුව වූ ඇගේ එකම පුතු මරණයට පත් වීමය. ඇගේ මහා ලතෝනි ශබ්දය නායින් නුවර කම්පාවට පත් කලාය. අසල්වැසියෝ ඇගේ නිවසට පැමිණ ඇයට උපකාර කලේය. ස්ත්‍රීහු ඇයව සනසන්නට උත්සහ කලහ. සියළු උත්සහයන් නිෂ්ඵල විය. ඇය සැනසීමට නොකැමති වූවාය. මැරුණ තරුණයාගේ දේහය අවසන් කටයුතු සඳහා සූදානම් කරන ලදී.

දේහය භූමදාන කරන දිනයේ අවමඟුල් පෙරහැර දේහය රැගෙන සොහොන් පල කරා ඇදුනි. මරණයට පත්වූ තරුණයාගේ මව වන වැන්දඹු ස්ත්‍රිය දරා ගත නොහැකි ශෝකයෙන් යුතුව පියවර මැන්නාය. අවමඟුල් පෙරහැර සොහොන්පල කරා යන මාර්ගයේ විශේෂ පුද්ගලයෙක් සිටගෙන සිටියේය. එතුමා සැනසෙන්නට නොකමැතිව වැලපෙන වැන්දඹු ස්ත්‍රිය දෙස අවධානයෙන් බලා ගෙන සිටි අතර එතුමාගේ හදවත ඇය කෙරෙහි අනුකම්පාවෙන් පිරී ගියසේක. තම හදවතේ මේ වැන්දඹුව ගැන අනුකම්පාව පිරී ගිය එතුමාණෝ නම් ජීවමාන මැවුම්කාර දෙවියන්වහන්සේගේ එකම පුත්‍රයා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. මෘත

ශරීරය ඔසවා ගත් පිරිස යේසුස්වහන්සේ පසුකරනවාත් සමග "අඬන්න එපා " යැයි උන්වහන්සේ ඇයට කී සේක. මේ අවස්ථාව වන විටත් ඇය මහ හයියෙන් හඬමින් සිටි නිසා උන්වහන්සේ මෙලෙස කියන්නට ඇත. නමුත් ඇයට කරන්නට තිබුන එකම දෙයද එයම පමණකි. දුක තුනී කර ගැනීමට හැඬීම එදත් අදත් හොඳ බෙහෙතකි. ඉන්පසු උන්වහන්සේ මෘත දේහයට අත ගසා "යෞවනය නැගිටින්නැයි" කී සේක. මහත් පුදුමයකි අවට සිටි පිරිසගේ "ඇස් උඩ ගොසින්ය". සමහරු හොඳටම භය වී ඇත. තවත් සමහරු දුවන්නට සැරසෙන්නට ඇත. මක්නිසාද මළ තරුණයා මළවුන්ගෙ න් නැගිට ඇත. යේසුස්වහන්සේ බොහෝ නිවිසැනසිල්ලේ ඔහුව දෙණයෙන් බස්සවා ඔහුගේ මව වූ කනවැන්දුම්යට ඔහුව භාර දුන්සේක. ඇගේ හදවතේ ප්‍රීතිය කෙබඳු වන්නට ඇතිද? නැවත ඇගේ ප්‍රීතිය සම්පූර්ණවන්නට ඇත. එදා ඇගේ හැගීම අද ජීවත්වන අපට තේරුම් ගන්නට පුළුවන්ද? ඇගේ ශෝකය මහත් ප්‍රීතියකට පෙරලී, ඇගේ විලාපය ප්‍රශංසාවට හැරුණි.

ඇයගේ ජීවිතය වෙනස් විය, ඇයට සියල්ල අලුත් විය. අවමගුල් පෙරහැර ජය ඝෝෂා කරන්නට විය. රැස්ව සිටි පිරිස දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් මහත් පුදුමයටත් ප්‍රීතියටත් පත් විය. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහත් බලපරාක්‍රමය එදින මහත් සමූහයක් දුටුසේක. මෙම සත්‍යය සිදුවීම ශුද්ධ බයිබලයේ ලූක් 7 පරිච්ඡේදයේ 11 පදයේ සිට 17 පදය දක්වා වාර්තා කර ඇත. මෙහි සඳහන් වන වාර්තා සහ සිදුවීම් දෙස බැලීමේදී සියල්ල කණගාටුදායක, ශෝකාකුල, බලාපොරොත්තු රහිත කාලකණ්ණි තත්වයක තිබූ නමුත් යේසුස්වහන්සේ එම නරක තත්වයට ඇතුල් වූ කල සියල්ල වෙනස් වී අලුත් වී ප්‍රීතිදායක, ආශිර්වාදමත් හා බලාපොරොත්තුවෙන් පිරි ස්භාවයකට පත් විය. ඔබත් ඔබගේ ජීවිතයේ මොන තත්වයක සිටියත් ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විශ්වාස කරන්න. උන්වහන්සේ ඔබගේ ජීවිතය සම්පූර්ණයෙන්ම වෙනස්කරනු නියතයි.

අප අපගේ වරද හා පාපා කරණ කොටගෙන මැරී සිටිය කල්හි යේසුස්වහන්සේ අප ජීවත් කල බව එපීස 2 : 1 හි සඳහන් වේ. ඕනෑම පව්කරුවෙකුගේ ජීවිතය අලුත්කර ජීවනය දිය හැක්කේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට පමණයි. එබැවින් උන්වහන්සේගේ මහත් ප්‍රේමය සහ කරුණාව කරණකොටගෙන ඔබ ඔබගේ ජීවිතයට නැවුම් භාවයක් සහ නව ජීවනයක් අත්කර ගන්න.

**ගුරුහරු**



# ආදර්ශය

මනුෂ්‍යයන් කිසිම කෙනෙක් එකම විදිහේ අදහස් දරන්නන් නොවේ. සෑම පුද්ගලයකුටම විවිධාකාර වෙනස්වූ අදහස් හා මතිමතාන්තර තිබෙනවා. ඇඳුම් පැළඳුම්, ජීවිත රටාව, වැඩ කරන පිළිවෙල වගේම එකම සිද්ධියක් ගැන වුවත් එකිනෙකා විවිධ මත දරනවා. මෙය පුද්ලගයාගෙන් පුද්ගලයාට වෙනස්වූ ඔවුන්ගේ අනන්‍යයතාවයි. එලෙසම සමහර පුද්ගලයන්ව ආදර්ශයට ගැනීම් හා අනුකරණය කිරීම් ගැනත් අප අත්දැකීමෙන් හෝ දැනගෙන සිටිනවා.

අවවාදයට වඩා ආදර්ශය උතුම් යැයි අප විශ්වාස කලත් ආදර්ශයට ගත යුත්තේ මොනවාදැයි ඔබ හොඳින් කල්පනාකර තිබෙනවාද? අනුකරණය කරන්නේ ජනප්‍රිය යැයි සලකන අයගේ ඇඳුම් පැළඳුම්, කොණ්ඩ මෝස්තර, කතා බහ කරන ආකාරය ලෙහෙසියෙන්ම අර්ථ දැක්වුවත්, ආදර්ශයට ගන්නේ මොනවාද? හොඳ ක්‍රියාවන්, යහපත් හැසිරීම්, මෘදු වචන යැයි ඔබ නිරායාසයෙන්ම පිළිතුරු දෙනු නොඅනුමානයි. නමුත් නිරන්තරයෙන්ම ආදර්ශය අපට ආශිර්වාදයක් වෙනවාද? අනෙක් අය අනුකරණය කිරීමෙන් ඔබගේ අනන්‍යයතාවය නැතිකරනවාදැයි ඔබත් හොඳින්ම සැලකිලිමත්වන්න.

ආදර්ශයන් නිසා අනෙක් අයට ආශිර්වාදයක්වූ චරිත වගේම ආදර්ශයන් නිසා තමන්වම විනාශයට පමුණුවාගත් උදාහරණත් ශුද්ධවූ බයිබලයේ සඳහන් වෙනවා.

යුද් 7 වෙනි පදයේ සඳහන් වන්නේ එවැනි එක් උදාහරණයකි. ''එසේ සොදොම සහ ගොමෝරාවද, අවට නුවරවල්ද මොවුන්සේම තුමූම වේශ්‍යාකමට භාරවී අන්‍යය මාංසය පස්සේ ගොස් සදාකාල ගින්නේ දඬුවම විඳිමින්, අවවාද ආදර්ශයක් කොට දක්වනු ලැබ සිටිති''.

මෙම පදය හොඳින් කියවා බලන්න. ''එසේ සොදොම සහ ගොමෝරාවද, අවට නුවරවල්ද මොවුන් සේම තුමූම වේශ්‍යාකමට භාරවී.....'' සොදොම සහ ගොමෝරාව දෙවියන්වහන්සේගේ විනිශ්චයට ලක්වූ ආකාරය ශුද්ධ බයිබලයේ උත්පත්ති පොතේ 19 වෙනි පරිච්ඡේදයේ සඳහන්වේ. ද්විතීය කථාව 29 : 23 හි සඳහන් ආකාරයට සොදොම සහ ගොමෝරාව සමග ඒ අවට නගරත් විනාශ වී තිබෙනවා. **''ස්වාමීන්වහන්සේ තමන් උදහසිනුත්, කෝපයෙනුත් විනාශකලාවූ සොදොම් සහ ගොමෝරාහිද අද්මා සහ ශෙබොයිම්හිද විනාශය මෙන් ....''**

''සොදොම සහ ගොමෝරාව විනාශවෙන්නට පළමුවෙන් එක ශෝවර දෙසට ස්වාමීන්වහන්සේගේ උයන මෙන්ද, මිසර දේශය මෙන්ද වුවේය'' (උත්පත්ති 13 : 10-11). ''සොදොමේ මනුෂ්‍යයෝ වනාහි දුෂ්ඨව ස්වාමීන්වහන්සේට විරුද්ධව අතිශයින් පව්කාරයෝව සිටියෝය'' (උත්පත්ති 13 : 13 ).

මෙම බයිබල් පද දෙක කියැවීමෙන් මෙම නගර දෙක ගැන ඔබට කිව හැක්කේ

කුමක්ද? බාහිර පෙනුම ඉතා හොඳින් පෙනුනත් අභ්‍යන්තරය කුණුවී ගඳ ගසන බවයි. මෙම පෙනුමට ලොත් රැවටී හසු වුණා. අද්මා සහ ශෙබොයිම්මුත් රැවටුණා. තම නුවරට සමීප සශ්‍රීකත්වයෙන් පිරුණු සොදොම සහ ගොමෝරාවේ පාපය වරදක් යැයි නොකියාම ඔවුන් ආදර්ශයට ගත්තා. නමුත් මෙම ආදර්ශයට ගැනීමේ ප්‍රතිඵලය නම් තමන් ආදර්ශයට ගත් අය සමඟම විනාශ වීමට සිදුවීමයි.

"ඉශ්‍රායෙල් පුත්‍රයෝ නැවත ස්වාමීන්වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුව තිබෙන දේ කර බාල් දේවතාවුන්ටත් අෂ්රොෂ්ටත්, සිරියේ දෙවිවරුන්ටත්, මෝවබ්හි දෙවිවරුන්ටත්, අම්මොන් පුත්‍රයන්ගේ දෙවිවරුන්ටත්, පිලිස්තිවරුන්ගේ දෙවිවරුන්ටත් සේවය කළෝය" ( විනිශ්චයකාරයා 10 : 6 ).

මෙම පදයට අනුව ඉශ්‍රායෙල්වරු සේවය කලේ කාටද? කානාන් දේශයේ ඔවුන් අවට සිටි සියළුම ජාතීන්ගේ දෙවිවරුන්ට ඔවුන් සේවය කල බව මෙහි සඳහන් වෙනවා. ඉශ්‍රායෙල්වරුන්ට උතුරින් සිරිය, ශිදොන්ද, දකුණින් මෝවබ්ද, නැගෙනහිරින් අම්මොන්ද, බස්නාහිරින් පිලිස්තිවරුනුත් වාසය කලහ. දෙවියන්වහන්සේගේ බලවත් ක්‍රියා හා උන්වහන්සේගේ මහන්තත්වය අත්දැකීමෙන්ම දත් ඉශ්‍රායෙල්වරු දෙවියන්වහන්සේව අත්හැර ආදර්ශයට ගත්තේ අන්‍යය ජාතීන්ගේ මනඃකල්පිත දෙවිවරුය. එහි අවසානය වුනේ එම ජාතීන්ටම ඔවුන් යටත්වීමයි. ඔවුන් දෙවියන්වහන්සේගේ තද විනිශ්චයට ලක්විය.

තම දේශය අවට සිටි අන්‍යය ජාතීන්ගේ ආදර්ශයට අනුව ක්‍රියා කිරීම නිසා ඉශ්‍රායෙල් ජනතාව දෙවියන්වහන්සේගේ විනිශ්චයට හසු විය. අද දෙවියන්වහන්සේගේ දරුවකු වන ඔබත් ලෝකයා නොහොත් ලෞකික අය ආදර්ශයට ගැනීමෙන් දෙවියන්වහන්සේව දුකට පත් නොකරන්න. දේව දරුවන්ට දෙවියන්වහන්සේගෙන් ලැබෙන ආශිර්වාද අහිමි කර නොගන්න.

ප්‍රිය සහෝදර සහෝදරිය,

1) වර්තමානයේ ඔබගේ තත්වයත් මෙයමද?

2) ඇදහිලිවන්තයෙක් ලෙස මෙම තත්වයට ඔබ මුහුණ දෙන්නේ කෙසේද?

3) ලෝකයා සමඟම ඔබත් දෙවියන් වහන්සේගේ විනිශ්චයට ලක් වෙනවාද?

4) ඔබගේ ජීවිත ආදර්ශය නිසා ලෝකයා දෙවියන්වහන්සේ අදහන්නට තීරණය කරයිද?

දෙවියන්වහන්සේගේ මඟ පෙන්වීම සහ කරුණාව ඔබ සමඟ වේවා

**සැකසුම**
**ශෂිලා වාසනා ද සිල්වා**

# කරුණාවේ නිවසේ සිටි නමුත් කරුණාව නොලැබූ අබ්බගාතයා

ලෝකප්‍රකට යෙරුසලම් නගරය පිළිබඳ නොදන්නා කෙනෙකු නැතිතරම්ය. අදද ජාත්‍යයන්තර ප්‍රවෘත්ති වල නිරන්තර කියවෙන යෙරුසලම් නුවර පිළිබඳ ලෝක ජනගහනයේ අවධානය සෑම කාලයේදීම යොමු වී තිබුණි. එය "දෙවියන්වහන්සේගේ නුවර" ලෙස සමහරු හඳුන්වයි. එම නගරය ඓතිහාසික මෙන්ම නිරන්තරයෙන්ම කතිකාවට ලක්වන නගරයක් වන අතර බයිබලය පුරාවට මෙම නගරය පිළිබඳව ලියවී ඇත. ජීවමාන දෙවියන්වහන්සේගේ මාළිගාව පිහිටා තිබීම මෙන්ම තවත් බොහෝ සාධක හා හේතු නිසා යෙරුසලම ලෝකවාසී සියළු දෙනාගේ අවධානයට ලක්ව ඇත. දේව වචනයේ සඳහන් අනාගතවාක්‍යයකට අනුව අතීතයට වඩා අනාගතයේදී මෙම නගරය වෙත ලෝක අවධානය යොමු වීමට නියමිතය.

එවකට තිබූ යෙරුසලම් නගරය විශාල තාප්පයකින් වටවී තිබූ අතර එය දොරටු දොළසකින් සමන්විත විය. එයින් එක් දොරටුවක් වූ "බැටළු දොරටුව" අභියස නගර දිශාවට ජලයෙන් පිරුණු විශාල පොකුණක් තිබූ බව බයිබලයේ යොහාන් 5 පරිච්ජේදයේ 2 වැනි පදයෙහි සඳහන් වේ. එම පොකුණ "බෙතෙස්දා" නම් විය. එහි තේරුම "කරුණාවේ නිවස" යන්නයි. මෙම පොකුණ වටේට මණ්ඩප (ශාලා) පහක් තිබූ බව සඳහන් වේ. එම ශාලා විවිධ අසනීප හා අබාධ සහිත රෝගීන් ගෙන් පිරී තිබුණි. මක්නිසාද මෙම පොකුණෙහි වතුර කැළඹෙන විට එම පොකුණට බැස්සොත් එම බසින පුද්ගලයා සතු රෝගය සුවවන බවට ඔවුන් තුල විශ්වාසයක් විය. එහි වතුර කැළඹීමට ස්වර්ගයෙන් දේවදූතයෙකු පැමිණෙන බවත් ඔවුන් තුල විශ්වාසයක් විය. සත්‍යය වශයෙන්ම දේවදූතයෙකු පැමිණියාද? නැද්ද? හෝ එය සත්‍යයද? නැද්ද? යන්න තහවුරු කිරීමට බයිබලය කිසිවක් නොපවසයි. නමුත් මෙම ස්ථානය එවකට ජනතාව අතර ප්‍රසිද්ධියටත්, ගෞරවයටත් පත්ව තිබුනේ මෙම රෝග සුවකිරීමේ බලය නිසාය.

මණ්ඩප පහකින් සතු මෙම පොකුණ සහිත පරිශ්‍රයේ සිටි විවිධ රෝගීන් අතර එක් විශේෂිත රෝගියෙක් විය. ඔහු අවුරුදු 38ක් ඔත්පලව සිටියේය. ඔහුත් මෙම බෙත්සෙදා ශාලාවට පැමිණ සිටියේ වතුර කැළඹෙන විට පොකුණට බැස සුවය ලබන පිණිසය. නමුත් ඔහු පැමිණ කොතෙක් කලක් ගතවුණාදැයි බයිබලයේ සඳහනක් නැත. නමුත් ඔහුට තනිවම වතුරට බැසීමට හැකියාවක් තිබුනේ නැත. එමෙන් ඔහුගේ උපකාරයට කිසිවෙක්ද සිටියේ නැත. මේ ආකාරයෙන් බොහෝ කලක් ගතවන්නට ඇත. ඔහු දැඩි සිත් වේදනාවටත්, අධෛර්යටත් පත්ව සිටියේය. කිසිවකුත් වතුරට බැසීමට ඔහුට උපකාර කලේ නැත. තමන්ගේ රෝගීන් සුවකර ගැනීම මිස අන් අය පිළිබඳ සැලකිල්ලක් දැක්වීමට කිසිවකු උත්සුක නොවන පරිසරයක අසරණයා සැමදාමත් අසරණ බවට පත්වෙයි. සමාජීය ප්‍රවණතාවය එය වුවත් තමකම හා තමන් පමණයි යන න්‍යාය පෙරදැරි කරගෙන ජීවත් වන ජන

සමාජය තුල ආදරය,කරුණාව අනුකම්පාව, පරාර්ථකාමී බව යන ගුණාංග එදත් අදත් ඇත්තේ අවම වශයෙනි.

අවු 38 ක් රෝගීව සුවය අපේක්ෂාවෙන් සිටි මෙම රෝගියාගේ අසරණ භාවය පිළිබඳ සිතේ බරක් ඇති කෙනෙක් සිටියේ නම් ඒ අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. එදින යෙරුසලම් නගරය ඉතාමත් උත්සවශ්‍රීයෙන් බැබළුන දවසකි. එදා යුදෙව් සංස්කෘතික මංගල්‍යය දිනයකි. අවට ගම්, නගර වලින් විශාල පිරිසක් යෙරුසලමට පැමිණ හා පැමිණෙමින් සිටින්නට ඇත. නමුත් යේසුස්වහන්සේ එදින යෙරුසලම් නගරයට පැමිණියේ මෙම උත්සවයට සහභාගී වීම සඳහාම නොවේ යැයි මට සිතේ. යොහාන් 6 :1 හි සඳහන් පරිදි යේසුස්වහන්සේ ඉන්පසු ගලීලයට ගිය බව සඳහන් වේ. යොහාන් 5: 8 සහ 9 පදවලට අනුව මෙම රෝගියා අවු 38ක් ඔත්පලව සිටි බවත්, මෙතනට පැමිණ බොහෝ කලක් ගතවී ඇති බවත් ඔහුට උපකාර කිරීමට කිසිවකු නොවූ බවත් යේසුස්වහන්සේ දැන ගෙන ඔහු ළඟට ගොස් ඔහුට උපකාර කල සේක. යේසුස්වහන්සේ ඔහුගෙන් ප්‍රශ්ණයක් ඇසූ සේක. "නුඹ සුවය ලබන්නට කැමතිද?" එවිට ඔහු "ඔව්" කීවේ නැත. කාලයක් තිස්සේ ඔහුට මුහුණ දීමට සිදුවූ අත් දැකීම ඔහු යේසුස්වහන්සේට පැවසුවේ සිතේ මහත් සැහැල්ලුවකිනි. ඔහුගේ දුක් ගැනවිල්ල යේසුස්වහන්සේ ඇසූ සේක. ඉන් පසු යේසුස්වහන්සේ රෝගය සුවකර ඔහු ගෙදර හැරිය සේක. අවු 38ක් රෝගයකින් දුක් විඳි අසරණ පුද්ගලයාට ස්වාමීවූ යේසුස්වහන්සේ උපකාර කල ආකාරයට ඔබටත් උපකාර කිරීමට උන්වහන්සේ අදත් ජීවමානව සිටින සේක. මෙහිදී අපට නැවතත් මතක් කර දෙන්නේ ජීවමාන දෙවියන්වහන්සේගේ කරුණා අනුග්‍රහයයි. එම කරුණාවෙන් ඕනෑම පුරුෂයෙකුට හෝ ස්ත්‍රියකුට දෙවියන්වහන්සේගේ දරුවකු විය හැක. අප එකිනෙකාගේ ජීවිත තුල දෙවියන්වහන්සේගේ කරුණා අනුග්‍රහය කරණකොටගෙන පව් සමාව පමණක් නොව මොලොව ආශිර්වාද පමණක් නොව සදාකාලික සුරක්ෂිත භාවය උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන අයට නොමිලේම ලබා ගත හැක.

දේවදරුවකුගේ ජීවිතයේ දෙවියන් වහන්සේගේ කරුණා අනුග්‍රහයෙන් පමණක් ඉටු වී ඇත් කරුණු 5ක් රෝම 8 : 29-30 පදවල සඳහන් වේ.

1) පූර්වයෙන් දෙවියන්වහන්සේ විසින් අපව හඳුනා ගැනීම හා තෝරා ගැනීම.

2) පූර්වයෙන් දෙවියන්වහන්සේගේ පුත්‍රයාගේ ස්වරූපයට සමාන වන පිණිස නියම කිරීම.

3) එලෙස නියම කල අයව නියම කාලයේදී කැඳවා ගැනීම.

4) ධර්මිෂ්ඨ කොට ගණන් ගැනීම, එනම් කිසිදු පාපයක් නොකල අය ලෙස දෙවියන්වහන්සේ විසින් පිළිගැනීම.

5) මහිමයට පත් කිරීම ( අනාගත දිනයකදී මුළු විශ්වය ඉදිරියේදී උන්වහන්සේ විසින්ම උන්වහන්සේගේ දරුවන්ව මහිමයට පත්කිරීම).

**ගුරුහරු**

# නිධානය



**"කෙතේ සඟවා තිබුණ වස්තුවකට ස්වර්ග රාජ්‍යය සමානය, මනුෂ්‍යයකුට එය සම්භව ඔහු එය සඟවා තබා ඒ ගැන සන්තෝෂයෙන් ගොස් තමා සන්තක සියල්ල විකුණා ඒ කෙත මිළදී ගත්තේය" (මතෙව් 13 : 44).**

ස්වාමීවූ යේසුස්වහන්සේගේ දේශණා සහ ඉගැන්වීම් වල බොහෝ දුරට උපමා අඩංගු විය. උන්වහන්සේ විසින් කියනු ලැබූ උපමා කතා විශාල ප්‍රමාණයක් ශුද්ධ බයිබලයේ අඩංගු වේ. මතෙව් 13 :44 වැනි එක පද උපමාව තුල විශාල ආත්මික පණිවුඩයක් ගැබ්ව ඇත. මෙම උපමාව යේසුස්වහන්සේ තමා ගැනම කී උපමාවකි.

මෙම කෙතෙහි සඟවා තිබූ වස්තුවක් පිළිබඳ උන්වහන්සේ කතා කරයි. කෙත ලෙස මෙහි හඳුන්වනු ලබන්නේ මේ ලෝකයයි. එනම් මිනිස් පරපුරයි. මිනිස් පරපුර අතර සඟවා තිබූ ඉතා වටිනා වස්තුව නම් සභාවයි. එනම් දෙවියන්වහන්සේ තෝරා ගත්තාවූ මනුෂ්‍යය කොටසයි. මෙය සදාකාලයේ පටන් සැඟවී තිබූ නමුත් දැන් එළිදරව් වී ඇත. එය සම්භවූ මනුෂ්‍යයා නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. සදාකාලයේ පටන් සඟවන ලද්දාවූ දෙවියන්වහන්සේ සන්තක සෙනග නැමති වස්තුවට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සතු සියල්ල නොහොත් තම ජීවිතය පූජා කර එම වස්තුව ලබාගත් සේක. උන්වහන්සේ එය ඉතා සන්තෝෂයෙන් කල සේක. එනම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සභාව උදෙසා තම ජීවිතය පූජා කලේ ඉතාමත් සතුටින් මෙන්ම ස්වකැමැත්තෙන්මය. සභාව මිළදී ගනු ලැබුවේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ වලිනි. යක්ෂයාගේ සහ පාපයේ වහලුන් ලෙස සභාව සිටියදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ජීවිතය පූජා කර තම රුධිරයෙන් පාප වන්දිය ගෙවා සභාව නොහොත් අප එකිනෙකා මිළදී ගත් සේක. **"නුඹලා නුඹලාට අයිති නැත. මක්නිසාද නුඹලා මිලේට ගනු ලැබුවහුය"(1 කොරින්ති 6 : 20).** මෙම උපමාව තුලින් අපට පෙන්නුම් කරනුයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපට කෙතරම් ප්‍රේම කර තිබේද යන්නය. සභාව යනු ගොඩනැගිලි හා අලංකාර ලෙස නිර්මාණය කර තිබෙන දේවස්ථාන නොවේ. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තමන්ගේ පුද්ගලික ගැළවුම්කාරයාණන් ලෙස අදහා පිළිගත්ත සියළුදෙනා (යොහාන් 1:12) සභාව ලෙස

දේව වචනයේ හඳුන්වයි. ඔබත්, මමත් සභාවය. සියළු ඇදහිලිවතුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාවය. එය සෑදී ඇත්තේ ගල්, සිමෙන්ති වලින් නොව ජීවමාන ගල් වලිනි. එනම් ඇදහිලිවන්තයන්ගෙන්ය. ( 1 කොරින්ති 2:9), (එපීස 2:20), (1 පේතෘස් 2:5) කියවා බලන්න. එමෙන්ම දෙවියන්වහන්සේගේ සභාව මිලේට ගනු ලැබුවේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ වලිනි. මෙය බයිබලය අපට පෙන්වාදෙයි (ක්‍රියා 20:28). වර්තමාන සභාව නොහොත් සියළු ඇදහිලිවන්තයන් පිළිබඳව දෙවියන්වහන්සේගේ හදවතේ තිබෙන ආශාව කෙතරම් මහත්ද? දෙවියන්වහන්සේට එය කෙතරම් වටිනවාද? යන්න මෙවැනි උපමා තව දුරටත් අධ්‍යයනය කිරීමෙන් අවබෝධ කර ගත හැක. සභාව යනු ඔබයි. එබැවින් දෙවියන්වහන්සේට ඔබ කෙතරම් වටිනා වස්තුවක්දැයි ඔබම තේරුම් ගන්න.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසියේ වැගිරූ ලේ වල ආනිසංස පහත දැක්වේ.

1) 1 යොහාන් 1 : 7- පාප පවිත්‍ර වීම

2) රෝම 5:9-ධර්මිෂ්ඨ කොට ගණන්ගනු ලැබීම (අපි කිසි පාපයක් නොකල ලෙස දෙවියන්වහන්සේ විසින් ගණන්ගනු ලැබීම)

3) හෙබ්‍රෙව් 9:14- හෘද සාක්ෂිය පවිත්‍ර වීම

4) හෙබ්‍රෙව් 10:20- දෙවියන්වහන්සේගේ අභිමුඛයට නිර්භීතව ලඟා වීමේ හැකියාව

5) එපීස 1:7- මිදීම ලබා දීම හා වරදට කමාව

6) 1 පේතෘස් 1:18-19 - ජන්මික පුරුදු වලින් මිදීම

7) එළිදරව් 1:5 සහ 12:11 - යක්ෂයාට ඉහලින් ජයග්‍රහණය

ඔබත් යේසුස් ක්‍රිස්තුස් වහන්සෙගේ ශ්‍රී රුධිරය යටතේ ආරක්ෂාව සහිත අයෙක්ද?



**නුඹලා වනාහි තෝරාගත් වංශයක්ද රාජකීය පූජකයෝද ශුද්ධ වූ ජාතියක්ද දෙවියන්වහන්සේ සන්තක සෙනගක්ද වන්නහුය (1 පේත්‍රුස් 2:9)**

# ක්‍රිස්තුස්වහන්සේ තුල උසස් දිවි පෙවෙතක්

**"ක්‍රිස්තුස්වහන්සේට එකඟ නැත්තාවූ මනුෂ්‍යාගේ පරම්පරාගත නියෝගවලත්, ලෝකයේ ගුරුකම්වලත් ප්‍රකාරයට තිබෙන පණ්ඩිතකමද, හිස්වූ රැවටිලිකාරකමද කරණකොටගෙන නුඹලා කොල්ලයක් කර ගන්න කිසිවෙක් නොසිටින හැටියට බලාගනිල්ලා" (කොලොස්සි 2 : 8).**

දෙවියන්වහන්සේගේ පරිපූර්ණතාවය සහ පූර්ණ විමුක්තිය නොහොත් ගැළවීම මනුෂ්‍යයා වෙතට ගෙනෙන ලද ක්‍රිස්තුස්වහන්සේ තුල පවතින ලෙස සියළු ඇදහිලිවන්තයන්ට ඉහත පදයෙන් අවවාද කරයි. ඇදහිලිවන්තයන් ක්‍රිස්තුස්වහන්සේ වෙතින් වෙනතකට යොමු කරන මනුෂ්‍යාගේ අදහස් උදහස් හා දර්ශණවාද මෙන්ම ලෝකයේ මුල් බැස ඇති විවිධ මතිමතාන්තර මෙම පදයෙන් පාවුල් තුමා දැඩි විවේචනයට සහ අපවාදයට ලක්කරයි. ක්‍රිස්තුස්වහන්සේගෙන් පැමිණෙන්නාවූ දැනුම හා ලෝකයාගෙන් එනම් මනුෂ්‍යයාගෙන් පැමිණෙන දැනුම අතර කිසිම සම්බන්ධතාවයක් නැත.

ඇදහිලිවන්තයන් වටා තිබෙන මනුෂ්‍යය සංකල්ප හා ලෞකික දර්ශනවාද මිත්‍යාදෘෂ්ඨිකය, වංකය මෙන්ම පුහුය. එමෙන්ම කිතුණු යැයි පවසන මනුෂ්‍යයන් විසින් ඉදිරිපත් කර ඇති කිතුණු මුහුණුවරක් ගන්නා සුළු අදහස් දර්ශණ සහ මතවාද බෙහෝමයක් කිතුණු ඇදහිලිවන්තයා විසින් පරිහරණය කරන අතර ඒවාද පුහු , ව්‍යාජ සහ මිත්‍යාවන්ය. දෙවියන්වහන්සේගේ එකම පුත්‍රයා වන යේසුස්වහන්සේගේ ප්‍රඥාව සහ ඉගැන්වීම අසහාය සහ අවංකය, ශුද්ධ සහ පරිපූර්ණය. ඇදහිලිවන්තයන් අතරේ දර්ශණවාද වලින් සම්මප්‍රලාප වලින් හා පරම්පරාගත නියෝග වලින් උගුල් ඇටවීමට හෝ ඇදහිලිවන්තයන් මුලා කර වීමට කිසිවකුට ඉඩ නොතැබිය යුතුයි. මනුෂ්‍යයන්ව, ඇදහිලිවන්තයන්ව රවටන සුළු වූ මෙවැනි අදහස් හා දර්ශණ පදනම් වී ඇත්තේ මිනිස් සම්ප්‍රදායන් හා යක්ෂයා මුල් කොට ගත් ඉගැන්වීම් වලිනි. ඇදහිලිවන්තයා තමන්ගේ ඇදහිල්ල ගැන ප්‍රවේශම් විය යුතුය. නැත්නම් ක්‍රමානුකූලව මනුෂ්‍යයාගේ නියෝග හා පණ්ඩිත කම නිසා ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහීමෙන් ඉවත් වී මුලාවනු ඇත. නමට පමණක් කිතුණුවෝ බවට ඔවුන් පත්වේ. දේව වචනය පරිශීලනය කිරීමත්, දෙවියන්වහන්සේ සමඟ සජීව සන්නිවේදනයක් නිරන්තරයෙන් පවත්වා ගැනීමත් හා ශුද්ධාත්මයාණන්වහන්සේට තම ජීවිතය තුල ක්‍රියා කිරීමට ඉඩ හැරීමත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්තරීතර පූජාව වූ කුරුසිපත් වීම, ක්‍රිස්තුස්වහන්සේ යනු දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ම බව ඇදහීම හා සභාව තුල සහභාගීකමේ නිරන්තර පැවතීමත් මඟින් ඇදහිලිවන්තයාට උසස්වූ ආත්මික ඇදහිලිවන්ත ජීවිතයක් ගත කිරීමට පුළුවන් වේ.

විවාදයෙන් හෝ තර්කයෙන් නොහොත් මනුෂ්‍යය ප්‍රඥාවෙන් දෙවියන්වහන්සේ ගැන හෝ ක්‍රිස්තුස්වහන්සේ ගැන දැන ගත නොහැකිය. ඒ දෙය කල හැක්කේ අපගේ සියළු සිතුවිලි ක්‍රිස්තුස්වහන්සේට යටත් කර දීමෙනි. ( 2 කොරින්ති 10 : 5 කියවන්න) යමෙකු ක්‍රිස්තුස්වහන්සේගෙන් නොවන ප්‍රඥාවට ප්‍රේම කරන්නේ නම් ඔහු ප්‍රේම කරන්නේ තේරුමක් නැති හිස් කමකටය.

එවැනි අය නිතර ඉගෙන ගන්නා නමුත් කිසිකලෙක සත්‍යය දැන ගන්නට බැරි අයවලුන්

ලෙස ශුද්ධ බයිබලයෙහි හඳුන්වා දෙයි. ( 2 තිමෝති 3 : 7 කියවන්න) දෙවියන්වහන්සේගෙන් හෝ ක්‍රිස්තුස්වහන්සේගෙන් නොවන දේ ලෞකික හා අද්භූත ඒවා වේ. එමෙන්ම ඒවා කිතුණු මිත්‍යාවන් ලෙසද හැඳින්විය හැක. ඒ පිළිබඳව ඇදහිලිවන්තයන් පරීක්ෂාකාරී නොවුවහොත් කිතුණු මිත්‍යාව ඔවුන් වහල් කර ගන්නවා ඇත.

ඇදහිලිවන්තයාගේ ජීවිතය උසස් ජීවිත රටාවක් සඳහා ගමන් කරන්නේ ඔවුන් තුල වැඩ වාසය කරන ක්‍රිස්තුස්වහන්සේගේ පරිපූර්ණත්වයෙනි. ක්‍රිස්තුස්වහන්සේ තුල දේවත්වය සහ මනුෂ්‍යය ස්භාවය යන දෙකම පරිපූර්ණ ලෙස වාසය කලේය.

ක්‍රිස්තුස්වහන්සේ මුළු හදවතින්ම විශ්වාස කරන අයට තවත් බලවේගයක පිහිට උපකාරය අවශ්‍යය නොවේ. නමුත් අවාසනාවන්ත ලෙස ක්‍රිස්තුස්වහන්සේ අදහන්නේ යැයි පවසන ඇදහිලිවතුන් මිත්‍යාවන්ට හසුවී ඇත. එබැවින් ඔවුන්ට ක්‍රිස්තුස්වහන්සේගේ පරිපූර්ණ ආත්මික ආශිර්වාදය ලැබීමට සහ ක්‍රිස්තුස්වහන්සේ තමන්ගේ එදානෙදා ජීවිතයට ප්‍රායෝගිකව ප්‍රබල ලෙස අත්දැකීම නොහැකි වී ඇත.

ක්‍රිස්තුස්වහන්සේගෙන් ඉවත් වී ලෞකික දේ අනුව ජීවත් වීමට අනුබල දෙන කිතුණු නායකත්වයෙන් ප්‍රවේශම් විය යුතුය. ඇදහිලිවන්තයාගේ වටපිටාවේ සිටින්නාවූ ලෞකික මනුෂ්‍යන් අතර ඇති තරඟකාරී භාවය ඇදහිලිවන්ත ජීවිතයට දැඩි බලපෑමක් එල්ල කරයි. එම තරඟකාරී ස්භාවයට මැදි වී තමන්ගේ ඇදහිල්ල නැතිකර ගත් අයද බොහෝ වෙති.

ගැලවීම ලැබූ අලුත ඉතා ප්‍රීතිමත් සැහැල්ලු දිවි පෙවෙතක් ගත කලත් ක්‍රමානුකූලව එම ප්‍රීතිය සහ සැහැල්ලුව ඔවුන්ගෙන් පලා යනු දක්නට ලැබේ. ඉන්පසු වෙහෙසකාරී මැසිවිලි සහිත ජීවිතයකට නිතැතින්ම ඔවුන් යොමුවේ.

ඇදහිලිවන්තයන් තමන්ගේ තත්වයට වඩා ඉහල ජීවිතයක් ගත කිරීමට උත්සහ කරයි. ආදායමට වඩා වියදම් කිරීම නිසා තමන් විසින්ම ප්‍රශ්ණ නිමාණය කර ගනියි. එමෙන්ම දෙවියන්වහන්සේගේ වචනය හා ගෞරවය සොයනවා වෙනුවට තම ගෞරවය හා තමා පමණක් යන මතය මත ක්‍රියා කිරීම නිසා ඇදහිලිවන්ත ජීවිතයේ තිබෙන සැනසිල්ල නැතිකර ගනියි. ඇදහිලිවන්තයා වනාහි ක්‍රිස්තුස්වහන්සේ තුල අලුත් මැවිල්ලක්ය. නැත්නම් අලුත ඉපදීම ලැබූ නැත්තෙකි (2 කොරින්ති 5 : 17) එමෙන්ම ඔහුට මේ ලෝකය අයිති නොවේ. ඔහුට අයිති මතුපැමිණෙන දෙවියන්වහන්සේගේ රාජ්‍යයටය(හෙබ්‍රෙව්13: 14)

එබැවින් මේ ලෝකයේ මාංශික තෘෂ්ණාවත්, පාපයත් ඇදහිල්ල කරණකොටගෙන ජය ගත යුතුය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය සහ නැවත නැගිටීම තුලින් මනුෂ්‍යන්ගේ දූෂිත, පාපිෂ්ඨ ස්භාවයෙන් ඇදහිලිවන්තයාට ජය ගත හැකිය. ඇදහිලිවන්තයාට තම ජීවිතයට නව බලයක් ලැබී තිබේ. ඒ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණා අනුග්‍රහයයි.

එබැවින් මතු පැමිණෙන නුවර බලාපොරොත්තු ඇතිව තම තමාගේ ජීවිතය පිළිබඳව ක්‍රිස්තුස්වහන්සේගේ සිංහාසනය ඉදිරියෙහි ගණන් දෙන්නට තිබෙන බැවින් අප එකිනෙකා කැඳවා තිබෙන උසස් කැඳවීමට අනුව ජීවත් වීමට අදිටන් කර ගනිමු.

**තබීතා**

# දරුවෝ



දරුවන් පිළිබඳව බයිබලය අපට පෙන්වා දෙන දිව්‍යය ප්‍රතිපත්ති මොනවාද? යන්න සොයා බැලීම අප කාහටත් මහත් ප්‍රයෝජනවත් වනවා නියතය. දෙවියන්වහන්සේගේ මුඛයෙන් නික්මුන වචනය වන ශුද්ධ බයිබලය මිනිසාගේ ජීවිතයේ සියළුම පැතිකඩ පිළිබඳ මග පෙන්වන අතර ප්‍රධාන ප්‍රශ්ණය වන පාපයට විසදුම ගෙන දෙයි. එය ප්‍රධාන මග පෙන්වීම වන අතර ඊට අමතරව මේ ලෝකයේ ජීවිතයට අවශ්‍යය සියළුම කරුණු කාරණාවන් ගැනත් බයිබලය විග්‍රහ කරයි. මිනිසාගේ මැවුම්කාරයාණන් වන දෙවියන්වහන්සේ පමණයි අප පිළිබඳව සියල්ල දන්නාවූ තැනැත්තාණන්.

වර්තමාන සමාජයේ දරුවන් පිළිබඳව වැඩි අවධානයක් යොමුවී ඇත. ලෝකයේ වැඩිම තාඩන පීඩන වලට ලක් වන්නේද දරුවන්ය. එමෙන්ම දරුවන් යහපත් මාර්ගයට ගෙන ඒමත් ඉතා දුෂ්කර වුත්, වෙහෙසකාරී ක්‍රියාවකි. එහෙත් ලොව වටිනාම වස්තුව දරුවන්ය.

ශුද්ධ බයිබලය පෙන්වා දෙන ආකාරයට දරුවන් පිළිබඳ සලකා බලමු.

### (1) දරුවන්ගේ අයිතිකාරත්වය

දරුවෝ දෙවියන්වහන්සේ දෙන උරුමයක්ය ( ගීතාවලිය 127 : 3 ).

සියළු දරුවන්ගේ අයිතිකාරයා වන්නේ මහෝත්තම දෙවියන්වහන්සේය. උන්වහන්සේගේ පරමාධිපත්‍යය අභිමතයන් උදෙසා දරුවන් මෙලොවට ප්‍රධානය කරන සේක. මේ ලෝකයේ ඉපදෙන සෑම දරුවෙකුටම මවක් හා පියෙක් සිටිනා බව සත්‍යයකි. එහෙත් අප සතු දරුවන්ගේ සැබෑ

අයිතිකාරයා මැවුම්කාර දෙවියන්වහන්සේය. ''දෙවියන්වහන්සේගේ උරුමයක්'' වන දරුවන් පිළිබඳ පරම අයිතිය හා ආධිපත්‍යය ඇත්තේ දෙවියන්වහන්සේටය. ඔවුන් නිර්මාණය කරනු ලබන දෙවියන්වහන්සේ ඔවුන් බිහිවෙන්ට සලස්වන සේක. අප මතක තබා ගත යුතු ප්‍රධාන කාරණය නම් දරුවන් අයිති දෙවියන්වහන්සේට බවත් , ඔවුන් දෙවියන්වහන්සේගේ උරුමය බවත්ය.

## (2) දෙවියන්වහන්සේගේ භාරකාරත්වය

මෙලොව දරුවකු බිහි වූ කල එම දරුවා ජාතක පියාට සහ වැදූ මවට එම දරුවාගේ භාරකාරත්වය ස්භාවයෙන්ම දෙවියන්වහන්සේ විසින් පවරනු ලැබේ. නමුත් ඔවුන් දරුවාගේ අයිතිකාරයන් නොවේ. දරුවන් අහිංසකය, එමෙන්ම අසරණය. එබැවින් දරුවන් හට මේ ලෝකයේදී කාගෙන් හෝ රැකවරණය අවශ්‍යය. දෙවියන්වහන්සේ මෙම රැකවරණය ලබා දීම සඳහා දරුවාගේ දෙමව්පියන් දෙදෙනාට භාර කරන අතර ඔවුන් එම දරුවා ඇති දැඩි කල යුතු වේ. මෙම භාරකාරත්වයට ආරක්ෂාව, පෝෂණය. මගපෙන්වීම, නිවැරදිකිරීම, ප්‍රේම කිරීම, අරමුණක් කරා පුහුණු කිරීම ආදී විශාල වගකීම් සම්භාරයක් අඩංගුය. දරුවන්ගේ භාරකාරත්වය මෙලොව දෙමව්පියන්ට දෙවියන්වහන්සේගෙන් ලැබුන භාරදූර වගකීමක් වන අතර එම වගකීම හරි හැටි ඉටු කිරීමට නම් දරුවන්ගේ අයිතිකාරයාගෙන් නොඅඩුව උදව් උපකාර ලබා ගැනීමට අවශ්‍යය වේ.

## (3) භාරකරුවන් හා අයිත්කාරයාණන් අතර සම්බන්ධතාවය

දරුවන්ගේ පරම අයිතිකරුවාණන් වන දෙවියන්වහන්සේ දරුවන්ගේ තාවකාලික භාරකරුවන් වන දෙමව්පියන් අතර හොඳ ශක්තිමත් සන්නිවේදනීය සම්බන්ධතාවයක් තිබිය යුතු අතර දිනපතා දෙමව්පියන් දෙවියන්වහන්සේ මත රඳා පැවතිය යුතුය. උන්වහන්සේගෙන් ඉගෙන ගත යුතු අතර දිනපතා බයිබලය කියවා යාච්ඤාකරන්නාවූ අය විය යුතුය. තම ජීවිතයේ සෑම අවස්ථාවකදීම දේව කැමැත්ත හා දෙවියන්වහන්සේගේ මග පෙන්වීම සොයන්නාවූ අය විය යුතු අතර නිරන්තරයෙන්ම දෙවියන්වහන්සේගේ ගෞරවය සොයන උන්වහන්සේට සැබෑ ලෙස නමස්කාර කරන්නාවූ අය විය යුතුය. දේව වචනයේ ඇති ප්‍රතිපත්ති ආරක්ෂා කරන්නාවූ දෙවියන්වහන්සේට විශ්වාසවන්ත අය විය යුතුය.

## භාරකරුවන්ගේ ආදර්ශමත් ජීවිතය

98% පමණ දරුවන් ඉපදෙන්නේ තරුණ දෙමව්පියන්ටය. එනම් අවු : 20-30 ත් අතර ඉතාම යොවුන් අවදියේ සිටින යුවලවල් දරුවන්ගේ භාර කරුවන් භවට පත් වේ. මෙම තත්වය තවත් තම කාර්යය ඔවුන්ට අමාරු කරවයි. තරුණ දෙමව්පියන් ලෙස දරුවකුගේ හෝ දෙදෙනකුගේ භාරකරුවන් බවට පත්වීම දෙවියන්වහන්සේගේ පැත්තෙන් මහත් ආශිර්වාදයක්ය. එහෙත් සමාජීය වශයෙන්

මහත් බැරෑරුම් කාර්යයකි. තමන් සෙවනේ ඩැඩෙන දරුවා වඩාත් සමීපව දකින්නේ තම දෙමව්පියන් හා ඔවුන්ගේ ක්‍රියාවන්ය. එබැවින් දෙමව්පියන්ගේ ආභාෂය දරුවන්ට ලැබේ. දෙමව්පියන්ගේ හැසිරීම් රටාව, කතාබහේ විලාශය අනුගමනය කිරීමට දරුවා නිතැතින්ම යොමුවීම වැලැක්විය නොහැක. එබැවින් දෙමව්පියන් දෙදෙනා ඉතාමත් ප්‍රවේශම්කාරී ජීවිත රටාවක් පවත්වා ගත යුතුය. තමන් කතා කරන වචන, ආශ්‍රය කරන මිතුරු මිතුරියන්, යන එන ගමන් බිමන් , නෑදෑයන් මේ හැම දෙයක්ම දරුවාගේ ජීවිතයට නොසෑහෙන බලපෑමක් ඇති කරයි. දෙමව්පියන් දෙදෙනාගේ අන්‍යෝන්‍යය බැඳීම හා දිනපතා සිදුවන ආශ්‍රය ගැන දරුවන් විසින් තම උකුසු ඇස යොමා ගෙන සිටියි. සමහරු කල්පනා කරන්නේ තම දරුවන් කුඩාය, අප ගැන වැඩි අවධානයක් නොමැති බවය. දෙමව්පියන්ගේ හැසිරීම් රටාව හා කතාබහ විලාශය දරුවන් විසින් තම ආභාෂයට ගොනුකර ගනී. එමෙන්ම දෙමව්පියන්ගේ ජීවන රටාව ඉතාමත් කල්පනාකාරී මෙන්ම බුද්ධිමත් විය යුතුය.

**එස්.මෙත්තානන්ද**

( මතු සම්බන්ධයි )



# උපාලි නන්දන ඉදිරිපත් කරන

## ප්‍රහේලිකාව

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | ස් | 2 | 3 | ■ | 4 | 5 |
| | ■ | 6 | | | ■ | |
| ■ | 7 | ■ | | ■ | 8 | |
| 9 | | මෝ | | ■ | ද | ■ |
| ■ | | ■ | ■ | 10 | | 11 |
| 12 අ | | 13 | 14 | | ■ | ස |
| | ■ | 15 ත | | ■ | 16 | |

## හරහට

1. ක්‍රියා 1 හමුවන බර්සබ්බස්ගෙ අනෙක් නම
4. මෙය නොකිරීමට කිතුබැතියාට අවවාද කෙරේ.
6. ශුභාරංචි කතුවරයෙකි.
8. මොවුන්ටද පාවුල්තුමා හසුන් පතක් යැවීය.
9. ප්‍රඥාවේ රජු හැටියට මොහු ප්‍රසිද්ධයි.
10. පාවුල් තුමාට ගල් ගැසුවේ මෙහිදීය.
12. ක්‍රියා පොතේ හමුවන ශක්තිමත් සභාවකි.
15. සදා යන අරුත
16. ධර්මිෂ්ඨකමේ වැස්ම මෙහි පැළඳ ගත යුතුයි.

## පහලට

1. ගෝත්‍ර 12 න් එකකි.
2. සිය යන අදහස ගෙන දේ.
3. මොහුගේ මුහුණ දේවදූතයකුගේ මුහුණ මෙන් පෙනුණේය.
5. ධර්මය.
7. පාවුල්තුමාගේ හවුල් සේවකයෙකි.
8. ක්‍රියා 21:1 සඳහන් කුඩා වරායකි.
10. මොහු වෛද්‍යවරයෙකි.
11. භය.
12. මම මිදිවැලය. නුඹලා ............................ ය.
13. වාක්‍යයක අවසානයට තබනු ලැබේ.
14. ස්වාමින් වහන්සේ ඉදිරියෙන් තාර්ෂිෂ්ට පලා යන පිණිස නැගිට ගිය අනාගතවක්තෘ කෙනෙකි.

# දුරකථන යාච්ඤා සේවය

සර්වබලධාරී දෙවියන්වහන්සේගේ බලයෙන් යාච්ඤාව කරණකොටගෙන

ඔබගේ ජීවිතයට නව ජීවනයක් ලගා කර ගත හැක.

ඔබගේ ජීවිතයේ ඇති විවිධාකාර දුක් කම් කටොළු වලට සර්වබලධාරී

දෙවියන්වහන්සේගෙන් පිහිට ලබා නිවිහැනහිල්ලේ ජීවත්වෙන්න.

**077 60 44 339**

දෙවියන්වහන්සේගේ පාදපාමුල සිට පාන්දර 4:00 සිට උදෑසන 6:00 දක්වා

දුරකථනයෙන් යාච්ඤා කිරීමේ සේවය.

අදම අපට කතා කර ඔබගේ අවශ්‍යතාවයට අනුව යාච්ඤා කර ගන්න

( කථාකිරීමට වඩාත් සුදුසු වේලාව වන්නේ පාන්දර 4:00 සිට

උදෑසන 6:00 දක්වාය )

